# වැසි ජලය

## ජල හිඟයට විසැඳුමක් ද.....?

**ජලය මිනිසාට අත්‍යාවශ්‍ය සම්පතකි. එමෙන්ම, මිනිසාට පානය කිරීමට සුදුසු ජලය සීමිත ප්‍රමාණයකි. දිනෙන් දින වැඩිවන ජනගහනය අනුව, ජල පාරිභෝජන අවශ්‍යතාවය ද වැඩි වෙමින් පවතී. භූගත ජලය දිනෙන් දින අඩු වෙමින් පවතින බව ද සඳහන් ය. කෘෂිකර්මාන්තය සඳහා ජලය යොදා ගැනීමෙන් විශාල වශයෙන් භූගත ජල මට්ටම අඩුවෙමින් පවතී.** තව ද, ඉතා සීඝ්‍රයෙන් සිදු වන නාගරීකරණය සහ කෘෂිකාර්මීකරණය නිසා ද, ජලය විශාල වශයෙන් ප්‍රයෝජනයට ගන්නා අතර, ජලය දූෂණයට පත්වීම නිසා බීමට නුසුදුසු තත්ත්වයට පත්වීම ද සිදු වේ.



වැසි ජල ටැංකියක්

**ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය** වසර 2003 දී ජල හිඟයකට මුහුණ පෑමට සිදුවන බවට ජනතාවට අනතුරු අඟවා තිබේ. ඊට පිළියමක් ලෙස ජල ප්‍රතිචක්‍රීකරණය හා බීමට ළිං සාදා ගැනීම ද යෝජනා වී තිබේ. මෙහි දී **ජල ප්‍රතිචක්‍රීකරණය ඉතා වියදම් අධික කාර්යයක් වේ.** එමෙන්ම, නගරාසන්නව භූගත ජලය දූෂණය වීම නිසා ළිං වලින් ද එතරම් ප්‍රයෝජනයක් ගත නොහැකි ය. මේ අනුව, අනාගතයේ දී ඇති වන නාගරීකරණය සහ කාර්මීකරණය තුළ පාරිභෝජනය සඳහා පිරිසිදු ජලය සොයා ගැනීම ප්‍රශ්නයක් වනු නොඅනුමාන ය.

ශ්‍රී ලංකාවට ලැබෙන සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මි.මී. 1250 කි. මෙ මගින් **ලංකා පොළොව මත වැටෙන ජලය වර්ෂයකට දළ වශයෙන් ඝන මීටර් මිලියන 131230 කි. (නරේසා 1991)** මෙයින් 40% - 65% ක් (ඝ.මීටර්. මිලියන 33300) කිසිදු ප්‍රයෝජනයක් නො ගෙන මුහුදට ගලා බසී. අතීතයේ **පරාක්‍රම බාහු** රජතුමා පවසා ඇති **"අහසින් වැටෙන එක දිය බිඳක්වත් ප්‍රයෝජනයට නො ගෙන මුහුදට ගලා යාමට ඉඩ දෙන්න එපා"** යන ප්‍රකාශයෙන්ම අපට වැටහෙන්නේ ශ්‍රී ලාංකිකයන් පුරාණයේ සිටම ජලයේ ඇති වැදගත්කම හොඳින් වටහාගෙන තිබූ බවයි.

### හෙළ සංස්කෘතිය

**ශ්‍රී ලංකාව ඓතිහාසික ජල සංස්කෘතියක් ඇති රටකි.** පුරාණයේ සිටම වැසි ජලය රැස් කර ගැනීම සඳහා විශාල බැමි

බැඳ වැව් තනා වියළි කන්නයේ වගාවන් සඳහා යොද ගැණුනි. ඉතා මෑත කාලයේ මහවැලි යෝජනා ක්‍රමය ද වැසි ජලය රැස් කර කෘෂිකර්මාන්තයේ

ඉඩෝර කාලයට ළිං ජලයේ ලවණතාවය වැඩිවන නිසා පුරාණ මිනිස්සු වැසි ජලය ප්‍රයෝජනයට ගැනීමට පුරුදුව සිටියහ.

ප්‍රයෝජනයට යෙදීමට දායක විය. දනට, ධාන්‍ය පාරිභෝජනය 75% ක්ම සහල් මගින් සපිරෙයි. වී අස්වැන්න තෙලා ගන්නා අක්කර ප්‍රමාණයෙන් 2/3 ක්ම වාරි වී ගොවිතැන් වෙයි. එය මුළු වී අස්වැන්නෙන් 3/4 ක් සපුරාලයි. **(බාකර් සහ සමාඩ් 1998)** වාරි ජලය සහ ගෘහ ප්‍රයෝජනය සඳහා මිනිසුන් මෙම ජලාශ ප්‍රයෝජනයට ගනී. මිනිස්සු බීමට සහ ගෘහ පාරිභෝජනයට ළිං වලින් ජලය ලබා ගැනීමට පුරුදුව සිටිති. මෙහි දී, භූගත ජල මට්ටම අඩුවන **ඉඩෝර කාලයට ළිං ජලයේ ලවණතාවය වැඩිවන නිසා පුරාණ මිනිස්සු වැසි ජලය ප්‍රයෝජනයට ගැනීමට පුරුදුව සිටියහ.**

**ශ්‍රී ලංකාවේ පුරාණ වැසි ජලය එකතු කිරීමේ ක්‍රම ඉතා දියුණු ජල සංස්කෘතියට උරුමකම් කියයි.** ජලය හිඟ ප්‍රදේශවල පුරාණ ශ්‍රී ලාංකිකයන් එසේ ජලය රැස් කිරීම සඳහා පාරම්පරික ක්‍රම භාවිතා කර තිබෙන බව සඳහන් ය. මේවා අධ්‍යයනය කිරීමේ දී ප්‍රධාන කොටස් තුනකට බෙද දක්විය හැකි වේ.

* පාරම්පරික දෑ පිහිලි වලට යොද ගනිමින් වහලයෙන් වැසි ජලය රැස් කිරීම
* ගස්වල කඳ දිගේ පෙරෙන වැසි ජලය එකතු කර ගැනීම
* විවෘත ස්ථාන වලින් කෙලින්ම වැසි ජලය එකතු කර ගැනීම

මෙහි පළමු ක්‍රමයේ දී සිදු කෙරුනේ කිතුල්, උණ බම්බු, කොළපත් වැනි ගමේ පහසුවෙන් සොයා ගත හැකි වූ අමු ද්‍රව්‍ය පිහිලි ලෙස යොද ගනිමින් වහලයේ වැස්සෙන ජලය යම් භාජනයකට රැස්කර ගැනීමයි. දෙවැනි ක්‍රමයේ දී සිදු වූයේ, තම ගෙවත්තේ ඇති පොල්, කොස් වැනි ගස්වල කඳට පොල් අත්තක් බැඳ ඒ කඳ දිගේ වැස්සෙන ජලය පොල් අත්ත මඟින් භාජනයකට රැස්කර ගැනීමයි.

ඇත්ත වශයෙන්ම, පළමු ක්‍රම දෙකේදීම ලැබෙන වැසි ජලය පිරිසිදු කමින් අඩු වුව ද, තෙවැනි ක්‍රමයේ දී විවෘත ස්ථානයක ජලය රැස්කර ගන්නා නිසා, එම ජලය පිරිසිදු බවින් වැඩි වේ. බොහෝ විට තෙවැනි ක්‍රමයේ දී සිදු කෙරුනේ කණු 4 ක් සාද එයට රෙද්දක් හෝ පොලිතීන් රෙද්දක් බැඳ, එය බොක්ක ගැසෙන සේ සකස් කර එහි මැදින් සිදුරක් සාද එය තුළින් ලැබෙන ජලය භාජනයකට රැස්කර ගැනීමයි.

තවත් සමහර ගැමියන් විශාල තල් අතු මඟින් හතරැස් සිමෙන්ති ටැංකි වලට වැසි ජලය එකතු කර ගනී. මේ සාමාන්‍යයෙන් ලීටර 1300 ක් පමණ වන ටැංකි වෙයි. ඌව පළාතේ **මොණරාගල** සමහර ගැමියන් කුඩයක් අනිත් පැත්තට හරවා එයට එක්කාසු වන ජලය බාල්දියකට එකතු කර ප්‍රයෝජනයට ගනී.

කෙසේ වෙතත්, තුන්වැනි ක්‍රමය ඉතා අඩුවෙන්ම ජලය අපවිත්‍රවන ක්‍රමය යි. මෙම ක්‍රමයෙන් එක්කර ගන්නා ජලය සාමාන්‍යයෙන් දින 2-3 කට පමණක් සෑහෙයි. ජල ප්‍රමාණය රැස්කර ගන්නා භාජනයේ ප්‍රමාණය සහ වර්ෂා කාලය මත රද පවතී. **බොහෝ ප්‍රදේශවල භූගත ජලය බීමට තරම් සුදුසු නොවේ.** එබැවින්, මෙම වැසි ජලය බීමට භාවිතා වෙයි. **මොණරාගල** ප්‍රදේශයේ පාරම්පරික ක්‍රම වලට වැසි ජලය රැස්කර ගන්නත් තම ගෘහ පාරිභෝජන ඉල්ලුම මෙයින් සපුරා ගනී **වැසි ජලය රැස්කර ගැනීමේ දී ඇතිවන තවත් බාධකයක් වන්නේ, වතුරෙහි මදුරු කීටයන් සෑදීම යි.** එයට ප්‍රධාන හේතුව වන්නේ අසාර්ථක කළමනාකරණ ය යි. ග්‍රාමීය ජනතාව නොයෙක් ක්‍රම වලින් වැසි ජලය රැස්කර ගනිමින් සිටියදී නාගරික ජනතාව අඩු ජල සැපයුම හෝ සම්පූර්ණ ජලය කපා හැරීම පිළිබඳව ජලය සපයන ආයතන වලට දෙස් කියමින් සිටී. කෙසේ වෙතත්, ඉතා ටික දෙනෙක් තම ගෘහ පාරිභෝජනය සඳහා වැසි ජලය රැස්කර ගන්නා පිරිස් නාගරිකව වෙසෙති.

ශ්‍රී ලංකාවේ පුරාණ වැසි ජලය එකතු කිරීමේ ක්‍රම ඉතා දියුණු ජල සංස්කෘතියට උරුමකම් කියයි.

## ජල නාස්තිය

නාගරිකයෝ විශාල වශයෙන් පිරිසිදු ජලය නාස්ති කරති. සාමාන්‍යයෙන් මෙම ප්‍රමාණය 40% - 50% ක් පමණ

වේ. **ජලය නාස්ති වීම අතින් (හේතුවක් සොයාගත නොහැකි ලෙස) අන් ජාතීන් අතර ඉහළම ස්ථානයක ශ්‍රී ලංකාව සිටී.** දෙවැනි වන්නේ **බංග්ලාදේශයට** පමණි. එසේ ශ්‍රී ලංකාවේ අපතේ යාම 50% ක් වන අතර බංග්ලාදේශයේ එය 65% කි. **ජර්මනිය, සිංගප්පූරුව** වැනි රටවල් බලන විට එය 3% ක් සහ 8 ක් තරම් කුඩා අගයකි. **(පිරිස් 1998)** මෙරට ග්‍රාමීය ජනතාව සම්බන්ධයෙන් සලකා බැලුවිට මෙය මහා අපරාධයකි. එයට හේතුව ගැමියන් පිරිසිදු ජලය ලබා ගැනීමට කි.මී. 10 ක් පමණ දුරක් ගෙවන විට නාගරික ජනතාව 50% ක් පමණ පිරිසිදු ජලය අපතේ හැරීමයි.

**ජලය නාස්ති වීම අතින් (හේතුවක් සොයාගත නොහැකි ලෙස) අන් ජාතීන් අතර ඉහළම ස්ථානයක ශ්‍රී ලංකාව සිටී.**

## වැසි ජලය රැස් කිරීම සඳහා නව තාක්ෂණය

ඉතා දියුණු ජල සංස්කෘතිය ට නෑකම් කියන ශ්‍රී ලංකාවේ වර්තමාන ඉංජිනේරුවන් විසින් වැසි ජලය රැස් කිරීම සඳහා ලීටර් 5000 ක ධාරිතාවයකින් යුතු ජල ටැංකියක් නිර්මාණය කර තිබේ. **ලෝක බැංකු** ආධාර යටතේ ක්‍රියාත්මක වන **ප්‍රජා ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය (CWSSP)** මගින් **බදුල්ල** සහ **මාතර** දිස්ත්‍රික්කවල ගෘහ මට්ටමේ වැසි ජලය රැස් කිරීමේ වැඩ පිළිවෙලක් දියත් කෙරේ. ඉහත තාක්ෂණය යටතේ ජලය රැස්කර ගැනීමට නිවසේ වහලය උපයෝගී කරගනු ලැබේ. මෙම ජල ටැංකියේ ප්‍රමාණය තීරණය කර ඇත්තේ උපකල්පන තුනක් මත පිහිටාය. එනම්, සාමාන්‍යයෙන් ග්‍රාමීය නිවසක වහලයේ වර්ග ප්‍රමාණය වර්ග මීටර් 60 ක් වශයෙන් ද, සාමාන්‍ය නිවසක වෙසෙන සාමාජික සංඛ්‍යාව 5 ක් වශයෙන් ද, එක් පුද්ගලයෙකුගේ දෛනික ජල පාරිභෝජනය ලීටර් 20 ක් ද වශයෙන් වේ. එවිට දින 50 ක් සඳහා නිවසකට අවශ්‍ය ජල ප්‍රමාණය ලීටර් 5000 ක් වේ. මෙම ටැංකි වර්ග දෙකකි. එනම්, ගඩොල් වලින් පොළොව යට සාදන කවාකාර ටැංකිය සහ පොළොව මතුපිට සාදන **ෆෙරෝ** සිමෙන්ති ටැංකිය යි. 1995 දී පිළිවෙලින් මෙම ටැංකි දෙක සඳහා වියදම රු. 6445/- ක් සහ රු. 8075/- ක් විය. මෙම වියදම් දෙකටම නුපුහුණු ශ්‍රම වියදම අඩංගු නොවේ. මෙම ජල ටැංකි ලබා දුන්නේ අවශ්‍ය නිවැසියන්ගේ ඉල්ලීම් මත පිහිටාගෙනය ප්‍රජා ජල සම්පාදක හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ මේවා ඉල්ලීම් කළ හැක්කේ ප්‍රජා සංවිධානය හරහා ය.

**ගෘහ පාරිභෝජනය සඳහා වැසි ජලය රැස්කර තබා ගැනීම තෙත් සහ වියළි යන කලාප දෙක සඳහාම යෝග්‍ය වේ.** කෙසේ වෙතත්, මධ්‍ය කඳුකර ප්‍රදේශවල වැසි ජලය රැස් කරන්නෝ ද බොහෝ දෙනෙක් ඒවා බීමට හා ආහාර පිසීමට හැර අනෙක් කටයුතු සඳහා පාවිච්චි කිරීමට පුරුදුව සිටිති. **බදුල්ල** දිස්ත්‍රික්කයේ වැසි ජලය රැස් කරන්නන් බොහෝ විට සේදීමට, වැසිකිළි සඳහා සහ වියළි කාලවල හරකුන්ගේ ප්‍රයෝජනයට ගනී. තවමත් බොහෝ දෙනෙක් බීමට සහ ඉවුම් - පිහුම් කටයුතු වලට ළිං වලින් සහ උල්පත් වලින් ජලය ලබා ගනී. කෙසේ වෙතත්, වැසි ජලය රැස් කිරීමට පටන් ගත් පසු උල්පත් සහ ළිං වලින් ජලය ලබා ගැනීමට ගත කළ කාලය බොහෝ සෙයින් අඩුකර ගැනීමට ගම්මුන්ට හැකියාව ලැබී ඇත.

නැගෙනහිර අප්‍රිකානු රටවල් හි, ප්‍රධාන ජල සැපයුම් මාර්ගය ලෙස වැසි ජලය යොදා ගැනුන ද, ශ්‍රී ලංකාවේ දැනට සම්පූර්ණයෙන්ම වැසි ජලය පමණක් ප්‍රයෝජනයට නොගැනේ. නමුත් **බදුල්ල** දිස්ත්‍රික්කයේ වැසි ජලය රැස් කරන්නන් එම රැස්කර ගත් වැසි ජලය, තද ඉඩෝර කාලයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ආරක්ෂා කර ගනී. මෙයින් ගම්මුන්ගේ ජලය පිළිබඳව ඇති සුරක්ෂිතභාවය තහවුරු වෙයි.

වැසි කාලවල දී වැසි ජලය පාවිච්චිය උපරිම මට්ටමකට සිදු කරයි. එයට හේතුව නිතර නිතර වැසි ලැබෙන නිසා කීහිප වතාවක් ටැංකි ජලයෙන් පිරී යාමයි. කෙමෙන් වැස්ස අඩු වී උල්පත් ජලය ටිකෙන් ටික අඩුවන විට වැසි ජලය ටැංකිය සම්පූර්ණයෙන්ම හිස් නොවීමට ගම්මුන් වග බලා ගනියි. මෙයට හේතු දෙකක් ඇත. එනම්, වියළි කාලවල දී ටැංකිය පිපිරීමෙන් ආරක්ෂා කර ගැනීම සහ

**ගෘහ පාරිභෝජනය සඳහා වැසි ජලය රැස් කර තබා ගැනීම තෙත් සහ වියළි යන කලාප දෙක සඳහාම යෝග්‍ය වේ.**

ටැංකියෙන් තුනෙන් දෙකක් සෑම විටම අනාගත ජල සුරක්ෂිතභාවය තහවුරු කර ගැනීම සඳහා තබා ගැනීම, වැසි ජලය රැස් කර ප්‍රයෝජනයට ගැනීම තම අවශ්‍යතාව සපුරනවා මෙන්ම

ජලය ලබා ගැනීමට යන කාලය අවම කර ගැනීමට හැකියාව ලැබේ. එමනිසා එකී පවුල්වල ජීවන රටාව පවා වෙනස් වී තිබේ. සමහර පවුල් මෙම ඉතිරිවන කාලය වෙනත් ආදායම් උපදවන මාර්ග සඳහා ද යොදවා ගෙන සිටී.

## පිරිසිදු බව

### වැසි ජලයේ පිරිසිදු භාවය

**වැසි ජලයේ ඇති පිරිසිදු භාවය පිළිබඳ පවතින සැකය සහ එහි ලවණ රහිත භාවය (මෘදු භාවය) එය බීම සඳහා පාවිච්චි කිරීමට ඇති බාධාවන් ලෙස සැලකිය හැකිය.** කෙසේ වෙතත්, බීම සඳහා ජලය ලබා ගන්නා වෙනත් ජල ප්‍රභවයන්ට හුරු වී ඇති තිවැසියන් වැසි ජලය පානය කිරීම සඳහා හුරු කිරීම ඉතා අසීරු කාර්යයකි. එයට හේතුව වන්නේ, වහලය සේදී එන වතුරෙහි අපද්‍රව්‍ය බහුල යැයි මිනිසුන් තුළ පොදු මතයක් පැවතීම යි. තව ද, **වැසි ජලය රැස් කිරීමට යොදා ගන්නා ටැංකිය, පිහිලි, වහලය වැනි දෑ පිරිසිදුව තබා නොගැනීම නිසා මදුරු කීටයන් සහ වෙනත් කෘමි සතුන් ටැංකියට පැමිණිය හැකිය.** මෙසේ මදුරු කීටයන් සිටින බවට බොහෝ වැසි ජලය ටැංකි හිමියන්ගෙන් පැමිණිලි ලැබී තිබේ. මෙම ගැටළු වලට ප්‍රධාන හේතුව වශයෙන් ටැංකිය හොඳින් වසා නො තැබීම සහ වැහි පිහිලිවල ජලය රැඳී තිබීම සඳහන් කළ හැකිය. හොඳින් වැසි ජල පද්ධතිය නඩත්තු කර, නිතර ඒ ගැන සැලකිලිමත් වීමෙන් මෙම ගැටළු පහසුවෙන් මඟ හරවා ගත හැකි වේ. **බදුල්ල** ප්‍රදේශයෙන් ගත් වැසි ජලය සාම්පල්වල තත්ත්වය පරීක්ෂා කිරීමේ දී එම ජලයේ අසූචිවල ඇති බැක්ටීරියා සොයා ගත නොහැකි වූ අතර ඉතා සුළු සාම්පල ප්‍රමාණයක වෙනත් බැක්ටීරියාවන් සොයා ගත හැකි විය. වෙනත් බැක්ටීරියාවන් සිටීමට හේතුව වන්නේ වහලයට කුරුල්ලන්ගේ අසූචි වැටී තිබීම සහ වහලය මත කාබනික අපද්‍රව්‍ය තිබීම යි.

> **වැසි ජලය රැස් කිරීමට යොදා ගන්නා ටැංකිය, පිහිලි, වහලය වැනි දෑ පිරිසිදුව තබා නොගැනීම නිසා මදුරු කීටයන් සහ වෙනත් කෘමි සතුන් ටැංකියට පැමිණිය හැකිය.**

කෙසේ වුව ද, ජලය උණු කර බීමට උණු කර බීමට ගැනීමෙන් මෙම ක්ෂුද්‍ර ජීවීන් විනාශ කර ගත හැකිය. ඒ ජලය නටන උෂ්ණත්වයේ දී බොහෝ ක්ෂුද්‍ර ජීවීන්ට පැවතිය නොහැකි නිසාය. **තවත් ජලයේ තත්ත්වයට බලපාන සාධකයක් වන්නේ ජලයේ ඇල්ගී වර්ධනය වීමයි.** ඊට හේතුව ජලය මත හිරු එළිය පතිත වීම සහ කාබනික ද්‍රව්‍ය ජලයට එකතු වීමයි. හිරු එළිය නොවැටෙන සේ ටැංකිය වසා තැබීමෙන් සහ හොඳින් වහලය සහ පිහිලි පුද්ධ කිරීම තුළින් මෙය මඟ හරවා ගත හැකිය.

**ජලයේ අපිරිසිදු භාවය මෙන්ම එහි ඇති මෘදු රසය ද මිනිසුන් වැසි ජලය බීමට උනන්දු නො කිරීමට හේතුවකි.** එහි මෘදු රසයට හේතු වන්නේ ඉතා අඩු ලවණ ප්‍රතිශතයකින් යුක්ත වීම යි. මෙහි දී, මෙම ජලය මැටි භාජනවල දමා තිබී ප්‍රයෝජනයට ගැනීමෙන් මෙම මෘදු ස්වභාවය මඟ හරවා ගත හැකි යැයි විශ්වාසයක් පවතී.

තව ද, **කුණ්ඩසාල** ප්‍රදේශයේ ගමකින් ලබා ගත් සමහර වැසි ජල සාම්පලයන් හි තරමක් ලා කහ පැහැයක් දැකිය හැකි වේ. එයට හේතු වන්නේ කාබනික ද්‍රව්‍ය ජලයට එකතු වී තිබීමයි. මෙම තත්ත්වය හොඳින් ජල පෙරණයක් භාවිතා කිරීමෙන් අවම කර ගත හැකිය. මෙම හේතු මඟ හරවා ගැනීම සඳහා මෑතක සිට ප්‍රජා ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘති යටතේ ඉදිවන ජල ටැංකි වල ගල් සහ වැලි යොදා සාදාගත් පෙරණයක් හරහා ටැංකියට ජලය ගලා යෑමට සලස්වා තිබේ. මෙහි දී, පෙනී යන්නේ වැසි ජලයේ පිරිසිදු භාවයට බලපාන සාධක කිහිපයක්ම ඇති බවත්, ඒ සියල්ල මනා නඩත්තුවක් පවත්වා ගන්නේ නම් මඟ හරවා ගත හැකි බවත් ය. මෙමඟින් බීමට සුදුසු තත්ත්වයේ වැසි ජලය රැස්කර ගත හැකිය.

> **ජලයේ අපිරිසිදු භාවය මෙන්ම එහි ඇති මෘදු රසය ද මිනිසුන් වැසි ජලය බීමට උනන්දු නො කිරීමට හේතුවකි.**

## වගා කටයුතු

### වැසි ජලය වගා කටයුතු වලට යොදා ගැනීම :

ප්‍රජා ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය මඟින් වැසි ජලය රැස් කිරීමේ තාක්ෂණය යොදා ගත්තේ විශේෂයෙන් ගෘහ පාරිභෝජනය සඳහා යි. කෙසේ වුව ද, මෙම තාක්ෂණය උපයෝගී කර ගනිමින් කුඩා පරිමාන වගා

කටයුතු වලට ජලය සැපයිය හැකිය. මෙහිදී ජලය සැපයීමේ **ඩ්‍රිප් ක්‍රමය** හෝ පොළොවෙහි මැටි කළගෙඩි වළලා එයට ජලය යොදන ක්‍රමය වඩා ඵලදායි වෙයි.

**වියළි කලාපයේ වෙසෙන ජනතාවට ද බීමට සුදුසු ජලය ලබා ගැනීම සඳහා බොහෝ විට, බොහෝ දුරක් යාමට සහ පෝලිමේ සිටීමට ද සිදු වේ.**

වැසි ජලය රැස්කර තබා ගැනීම ජල ප්‍රශ්න ඇති වියළි කලාපයේ ගොවිජන කේන්ද්‍ර වලට සුදුසු බව **හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය** විසින් යෝජනා කරන ලදී. මෙහි දී නියමු ව්‍යාපෘතියක් ලෙස **හෙ.කො.ගො.ප.හා පු. ආයතනය පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටා ඇති තබ්බෝව ගොවි ජන කේන්ද්‍රයේ ලීටර් 5000 ක ධාරිතාවකින් යුත් වැසි ජල ටැංකියක් ඉදි කර තිබේ.** මේ සඳහා **හලාවත** ගොවිජන සේවා කාර්යාලයේ තාක්ෂණික සහය ලබා දී ඇත.

මෙසේ සලකා බැලීමේ දී වැසි ජලය රැස් කිරීම මගින් ඉතා විශාල ලෙස ජල හිඟයෙන් මිදීමට හැකියාව ලැබෙන බව කිව හැකිය. තව ද, **විශේෂයෙන්ම පිරිසිදු ජලය පානය කිරීමට ඉතාම විශ්වාසදායි ක්‍රමයක් ලෙස මෙය හැඳින්විය හැකිය.** කඳුකර ප්‍රදේශවල ජීවත්වන ජනතාවට ජලය ලබා ගැනීම සඳහා කඳු පාමුලට ගමන් කිරීමට සිදුවන්නේ කඳු උඩ ජලය නොමැති නිසාය. නමුත් හරිහැටි පාරක්වත් නොමැති ඉතා දුෂ්කර ප්‍රදේශවල කඳු මුදුන්වල වෙසෙන ජනතාවට වැසි ජලය රැස්කර තබා ගැනීම තුළින් තම වටිනා කාලය වෙනත් දෙයක් සඳහා යෙදවීමට හැකියාව ලැබේ. **වියළි කලාපයේ වෙසෙන ජනතාවට ද බීමට සුදුසු ජලය ලබා ගැනීම සඳහා බොහෝ විට, බොහෝ දුරක් යාමට සහ පෝලිමේ සිටීමට ද සිදු වේ.** එම නිසා වියළි කලාපීය ජලය ඉතා අමාරු ප්‍රදේශවල ජනතාවට ද මෙම වැසි ජලය රැස්කර ප්‍රයෝජනයට ගැනීම ඉතාම පහසු කාර්යයක් වෙයි.

20 වැනි සියවසේ දී මෙයට වඩා කර්මාන්ත ශාලා වැඩි වී ජලය දූෂණය වීම ඉතා සීඝ්‍රයෙන් සිදුවිය හැකිය. මේ නිසා භූගත ජලය ද බීමට නුසුදුසු තත්ත්වයකට පත්විය හැකිය. එවැනි අවස්ථාවක බීමට ඉතාම පිරිසිදු ජලය මෙමගින් ලබා ගැනීමට හැකිවීම මෙහි ඇති තවත් වාසියකි. නගරයේ වෙසෙන ජනතාවට ද ජල සැපයුම නතර වූ විටක ප්‍රයෝජනයට ගැනීම සඳහා වැසි ජලය එකතු කර ගත හැකිය.

**ඩී.ජී. කරුණාරත්න**

**සංඛ්‍යාන නිලධාරී**

**වාරි ජලකළමනාකරන හා ගොවි ජන සම්බන්ධතා අංශය**

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය